**ශීර්ෂය 20 - මැතිවරණ කොමිෂන් සභාව**

**---------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මැතිවරණ කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජුනි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2021 අගෝස්තු 05 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020දෙසැම්බර් 31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශනිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධානගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පවිත්‍රතා සේවා හා ආරක්ෂක සේවා වියදම වූ රු.1,465,847 ක් ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ වැය විෂයය යටතේ ගිණුම්ගත කර තිබුණි. | ආරක්ෂක හා පවිත්‍රතා සේවා වෙනුවෙන් සාමාන්‍ය කාල වලට වඩා මැතිවරණ කාල සීමාවක දී විශාල සේවක පිරිසක් යෙදීමට සිදු වීම හා සති අන්ත හා රජයේ නිවාඩු දින වල මෙම සේවකයින් සේවයේ යෙදවීම නිසා වෙනදාට වඩා අතිරේක වියදමක් දැරීමට සිදු වේ. මෙම අතිරේක වියදම් මැතිවරණය පැවැත්වීම නිසාම සිදුවන බැවින් එලෙස ප්‍රතිශතාත්මක අගයක් මැතිවරණ වැය විෂයය යටතේ දරා ඇත. | වියදම් නිවැරදි වැය විෂයය යටතේ ගිණුම්ගත කළ යුතු වේ. |

### 1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වාහන, ඉඩම් හා ගොඩනැගිලි සහ යන්ත්‍ර හා කාර්යාල උපකරණවල ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ හා සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ අතර වෙනස පිළිවෙලින් රු.7,134,127 ක්, රු.1,204,464,069 ක් සහ රු.25,712,259 ක් විය. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල ආරම්භක ශේෂය සමග ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂය නොගැලපීම ඉදිරියේදී නිවැරදි කිරීම උදෙසා කටයුතු සිදු කර ඇති අතර තව දුරටත් පවතින වෙනස්කම් වලට හේතු හඳුනා ගැනීමෙන් පසු අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදිව ශේෂ දැක්විය යුතු වේ. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර තිබූ රු.15,400,000ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොමිෂන් සභාවට පවරා තිබූ බදුල්ල රත්වත්ත මාවත ගොඩනැගිල්ල හා ඉඩමද තමන්කඩුව ප්‍රදේශයේ නිල නිවසද ආපසු දිස්ත්‍රික් ලේකම්වරයා වෙත පවරා ඇති අතර මෙය ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කර ඇති නමුත් CIGAS වැඩසටහන මගින් ගිණුම් ගත කිරීම ඉවත් කර නොමැත. එබැවින් එය ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | ස්ථාවර වත්කම් ලේඛනය අනුව ඉඩම් හා ගොඩනැගිලි 05 ක වටිනාකම රු.170,294,314 ක් වුවත් රු.132,127,314 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ඉදිරි වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | 2010 වර්ෂයේ කොමිෂන් සභාවට පවරා තිබුණු රු.25,748,000 ක් වටිනා දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස්වරයකුගේ නිල නිවසක්,මැතිවරණ කාර්යාලයක් හා ඒවාට අයත් ඉඩම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මඩකලපුව කාර්යාල ගොඩනැගිල්ල හා ඉඩම තක්සේරු කිරීම සඳහා කටයුතු කෙරෙමින් පවතින බැවින් ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කිරීමටත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන වල ස්ථාවර වත්කම් වටිනාකම CIGAS වැඩසටහන මගින් නිවැරදි කිරීමටත් කටයුතු කරනු ලැබේ. | -එම- |
| (ඉ) | නීත්‍යානුකූලව අයිතිය පවරා ගෙන නොමැති රු.1,142,185,612 ක් වටිනා ඉඩම් 09 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | කොමිෂන් සභාව වෙත පවරා ඇති එහෙත් මේ වන තෙක් ඔප්පු නිරවුල් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ. | කොමිෂන් සභාව සතු ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කඩිනමින් ක්‍රියා කළ යුතු වේ. |
| (ඊ) | 2018, 2019 හා 2020 වර්ෂවල අපහරණයන් පිළිබඳ උපලේඛනය හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් අපහරණ පිරිවැය අතර පිළිවෙලින් රු.3,883,977 ක් රු.4,953,979 ක් හා රු.11,307,281 ක් ලෙස වෙනස්කම් පැවතුණි. | නොගැලපීම් සම්බන්ධයෙන් සැසඳීම් සිදු කර වෙනස්කම් සිදු කිරීමෙන් පසු නිවැරදි අපහරණ භාණ්ඩ පිළිබඳ උපලේඛන ගිණුම් අංශය වෙත ලබා ගැනීමෙන් පසු මෙම වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වත්කම් අපහරණයට අදාල නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

**1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය දළ පදනමින් පිළියෙල නොකිරීම නිසා පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්, භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිල දී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්, අග්‍රිම නොවන ලැබීම්, අත්තිකාරම් අය කර ගැනිම්, තැන්පතු ලැබීම් හා තැන්පතු ගෙවීම් යනාදියෙහි රු.92,705,545 ක වෙනසක් නිරීක්ෂණය විය. | හරස් සටහන් හැර මුදලින් සිදු කල ප්‍රමාණය පමණක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන ඇත. | නිවැරදිව සටහන් කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේරු.4,209,529 ක්වූ තුල සහනාධාර හා මාරුකිරීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ සටහන් කර නොතිබුණි. | දේපළ ණය පොලී සඳහා 1506 වැය විෂයය යටතේ දරන ලද වියදම් අතපසු වීමකින් සහනාධාර හා මාරු කිරීම් යටතේ සටහන් කර නොමැත. | නිවැරදිව සටහන් කළ යුතු වේ. |

**1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | හානි පිළිබඳ ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කිරීමට පියවර ගෙන ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix වැනිපරිච්ඡේදයේ 5.2 හා 5.3 ඡේදය | විධිවිධාන වලට පටහැනිව නිවාස කුලී ලෙස කොමිෂන් සභාවේ සභාපතිවරයාගෙන්, සාමාජිකයෙකුගෙන්සහ නිලධාරීන් දෙදෙනෙකුගෙන් පිළිවෙලින් මාසයකට රු.2,000 සහ රු.1,500 බැගින් ආර්ථික කුලී අයකර තිබුණි. | මෙම ගොඩනැගිල්ල පැරණි කාර්යාල ගොඩනැගිල්ලක් වන අතර අලුත්වැඩියා කර නිලධාරීන්ට නවාතැන් ගැනීම සඳහා ලබා දී ඇත. මෙය නිල නිවාසයක් වශයෙන් භාවිතා කිරීමට තරම් සුදුසු පහසුකම් නොමැති බැවින් එවකට මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගන්නා ලද තීරණයකට අනුව ආර්ථික කුලියක් අය කිරීමට කටයුතු කර ඇත. | නිවාස කුලී අය කිරීමේ දී ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතු වේ. |

(ආ) **අමාත්‍ය මණ්ඩල තීරණ**

-------------------------

| | | | | |
|---|---|---|---|---|
| 2016ජූලි05දිනැති අංකඅමප/16/1261/702/ 037-1 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | (i) | කොමිෂන් සභාවේ සභාපතිවරයාට සමාලෝචිත වර්ෂයේ මාස 08 ක් සඳහා රු.374,460 ක ඩීසල් ලීටර 1,456 ක් හා පෙට්‍රල් ලීටර 1,628 ක් අනුමත සීමාව ඉක්මවා ලබා දී තිබුණි. | මැතිවරණ කටයුතු සම්බන්ධයෙන් විවිධ රාජකාරි අවශ්‍යතාවයන් සඳහා දිස්ත්‍රික්කයෙන් දුර බැහැරව ප්‍රදේශවලට යැමට සිදුවන අවස්ථා වල දී නිල වාහනය සඳහා මාසිකව ලබා දෙන ඉන්ධන ප්‍රමණවත් නොවන බැවින් අමතර ඉන්ධන අවශ්‍යතා මෙලෙස ලබා දී ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දීමනා ගෙවීම සිදු කළ යුතු වේ. |
| | (ii) | කොමිෂන් සභාවේ සභාපතිට හා අනෙකුත් සාමාජිකයින්ට සමාලෝචිත වර්ෂයේ මාස 03 ක් සඳහා අනුමත දීමනාවට අමතරව රු.60,000 ක විශේෂ දුරකථන දීමනාවක් ගෙවා තිබුණි. | මැතිවරණ කාල සීමාවක් තුල දේශපාලන පක්ෂ හා අනෙකුත් පාර්ශවකරුවන් සමඟ රාජකාරි අවශ්‍යතා සඳහා සංනිවේදන කටයුතු සිදු කිරීමේ දී ඉහත චක්‍රලේඛයෙන් වෙන් කර ඇති සීමාව ඉක්මවා නිවාස දුරකථනය, ජංගම දුරකථන සඳහා සංනිවේදන වියදම් දැරීමට සිදු වූ බැවින් එම කාල සීමාවට සරිලන පරිදි කොමිෂන් සභාවේ අනුමැතිය මත මෙම විශේෂ දුරකථන දීමනා කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින්ට ගෙවා ඇත. | -එම- |
| | (iii) | කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයින්ට සමාලෝචිත වර්ෂයේ මාස 03 ක් සඳහා අනුමත දීමනාවට අමතරව රු.42,000ක විශේෂ මැතිවරණ රාජකාරි දීමනාවක් ගෙවා තිබුණි. | ඡන්ද විමසීමක් පවත්වා ඡන්දය ගණන් කර ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරීම දක්වා දක්වා දැඩි වෙහෙසක් දරා කටයුතු කිරීම වෙනුවෙන් අනෙකුත් මැතිවරණ කාර්ය මණ්ඩලයට ගෙවූ ඡන්ද පොළ කටයුතු ප්‍රතිඵල ප්‍රකාශ කිරීමේ | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි දීමනා ගෙවීම සිදු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | දීමනා හා දුර ප්‍රමාණය නොසලකා එදිනට ගෙවන සංයුක්ත දීමනාව කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින්ට ගෙවීම සාධාරණ හා යුක්ති සහගත වන බැවින් එම දීමනා ගෙවා ඇත. | |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වැඩ තහනමට ලක්ව තිබූ සේවකයකුගෙන් රු.164,811ක ණය ශේෂයක් අය වීමට පැවතුණි . | සේවකයාට සිහි කැඳවීමේ ලිපි යවා ඇති අතර ඉදිරියේදී ඇපකරුවන්ගෙන් ණය අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | ණය අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 2.3 අවිධිමත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොමිෂන් සභාවට අයිති දේපළක් සඳහා මෙට්‍රෝ කොළඹ නාගරික සංවර්ධනව්‍යාපෘතියෙන් ගෙවන ලද රු.5,200,000 කදේපළ හානි වන්දි කොමිෂන් සභාවේ සභාපතිවරයා, එක් සාමාජිකයෙකු සහ නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබා ගෙන තිබුණි. | කොමිෂන් සභාවේ සභාපති හා එක් සාමාජිකයකු ඇතුලු තවත් නිලධාරින් දෙදෙනෙකුට සිදුකර ඇති මෙම ගෙවීම මැතිවරණ කොමිෂන් සභාව දැනුවත් කර කොමිෂන් සභාවේ නිල බැංකු ගිණුම හරහා සිදු වි නොමැත. ඒ සම්බන්ධයෙන් අදාල ගෙවීම් සිදු කළ ආයතනයෙන් කරුණු පැහැදිලි කර ගැනීම සුදුසු බව කාරුණිකව දන්වමි. | නිවැරදි කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) | 2016 ජුලි 05 සිට අනුමැතිය ලබා දී ඇති අමාත්‍ය මණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කොමිෂන් සභා සාමාජිකයින්ට තම පදිංචි ස්ථානයේ සිට කොමිෂන් සභා කාර්යාලයට යාමට ඇති දුර කී.මී.350 ට වැඩි නම් රු.50,000 ක | 2016 ජුලි 05 වන දින සිට ලබා දී ඇති අමාත්‍යමණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කොමිෂන් සභාවේ මෙම සාමාජිකයාට ප්‍රවාහන දීමනා ගෙවා ඇත. එම දීමනා ඔහුගේ යාපනය | අමාත්‍ය මණ්ඩල තීරණ හා පාර්ලිමේන්තු යෝජනා සම්මුතිය අනුව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| ප්‍රවාහන දීමනාවක් හිමි වුවද කොමිෂන් සභාවේ නිල නිවසක ආර්ථික කුලියක් ගෙවමින් පදිංචිව සිටි කොමිෂන් සභා සාමාජිකයෙකුට වසර 04ක කාලයක් සඳහා රු.2,400,000 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | ප්‍රදේශයේ ස්ථිර පදිංචි නිවසේ සිට රාජගිරිය මැතිවරණ මහ ලේකම් කාර්යාලයට පැමිණීමට සහ නැවත නිවසට යාමට පමණක් අදාළ වේ. | |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **ප්‍රසම්පාදනයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.597,618 කපිරිවැය වූ අත් පිරිසිදුකාරක දියර කෑන් මිල දී ගැනිමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.2 ඡේදයප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2020 මැයි මාසය වන විට කොවිඩ් 19 වසංගත තත්වයේ අවදානම දිවයින පුරා පැතිරීම හේතුවෙන් රජයේ මෙන්ම පෞද්ගලික ආයතනවල දෛනික කටයුතු නතර කර තිබුණි. මේ අතර 2020 පාර්ලිමේන්තු මැතිවරණයට අදාල මූලික කටයුතු ඉදිරියට කරගෙන යාමට සිදු වූ නිසා පිරිසිදුකාරක දියර කඩිනමින් මිලදී ගැනීමට සිදුවිය. එහිදී රජයට අවාසියක් නොවන පරිදි අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතනයකින් මෙම මිලදී ගැනීම සිදු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (ආ) ඡේදය ප්‍රකාරව රු.89,319,056 ක් වටිනා අත් පිරිසිදුකාරක මිල දී ගැනීමේ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂය පිළිබඳ විශේෂඥයකු පත් කර නොතිබුණි. | අත්පිරිසිදුකාරකමිලදී ගැනීම සඳහා පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවට ප්‍රසම්පාදන කාර්ය පටිපාටිය පිළිබඳව ප්‍රමාණවත් දැනුම ඇති නිලධාරීන් අන්තර්ගත විය. තාක්ෂණික විශේෂඥයින් නොමැති නිසා සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් මෙම මිලදී ගැනීමට අදාළ පිරිවිතර විද්‍යුත් තැපැල් ක්‍රමයට මැතිවරණ කොමිසම වෙත ලබා ගෙන ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයේ සිට පිරිවැය රු.144,900 ක්වූ යතුරු පැදියක් භාවිතයෙන් තොරව පැවතුණි. | ඊළඟ වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේ දී මෙම යතුරු පැදිය මිල ගණන් කැඳවා අලෙවි කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. | වත්කම් උපරිම ඵලදායිතාවයෙන් යුතුව භාවිත කළ යුතු වේ. |
| (ආ) | කොමිෂන් සභාව සතු නොවන ඉඩමක රු.1,771,701වියදමින් ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | ප්‍රධාන කාර්යාලයට යාබදව පිහිටි හීන්ඇල පරිශ්‍රයේ ඇති කොමිෂන් සභාව සතු ඉඩම පැවරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. | කොමිෂන් සභාවට අයත් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.3 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 හා 2019 වර්ෂවල සිට පැවත එන එකතුව රු.122,900 ක්වූ අලාභ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරවකටයුතු කර නොතිබුණි. | මේ සඳහා ප්‍රතිපාදන වෙන්කර ගෙන නොමැති බැවින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමෙන් අනතුරුව පොත් වලින් කපා හැරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

### 3.4 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 වර්ෂයේ සවි කළ කැමරා පද්ධතිය ඉවත් කර රු.2,542,004 ක්වටිනා කැමරා 52 කින් යුතු නව පද්ධතියක් ස්ථාපිත කර තිබුණු අතර පැරණි පද්ධතියේ කැමරා 12 ක් භාවිතයට ගෙන තිබුණද ඉතිරි කැමරා 20 භාවිතයෙන් තොරව පැවතුණි. | කැමරා 52 කින් යුත් නව කැමරා පද්ධතිය සවිකිරීමට කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය ලබාගෙන ඇත. ඉවත් කළ කැමරා පද්ධතියෙන් කැමරා 12ක් ගම්පහ කාර්යාලයට ප්‍රමාණවත් වූ බැවින් එම ප්‍රමාණය ගම්පහ කාර්යාලයේ ස්ථාපිත කරන ලදි. ඉතිරි කැමරා ප්‍රමාණය වෙනත් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයක අවශ්‍යතාව සොයා බලා ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියා කරනු ලැබේ. | අවශ්‍යතාවයන්ට අනුව මිලදී ගැනිම් සිදු කළ යුතු වේ. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාව විසින් තිරසාර සංවර්ධන ඉලක්කයන් හඳුනා ගැනීම සිදු කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය අනුව තිරසාර සංවර්ධන අරමුණු කෙරෙහි මැතිවරණ කොමිෂන් සභාව සෘජුවම සම්බන්ධ නොවන ආයතනයන් වුවද වක්‍ර ආකාරයෙන් සමන්විත කාර්යන්ට අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේ දී ප්‍රතිපාදන වෙන්කර ගනු ලැබේ. එම ප්‍රතිපාදන උපයෝගී කර ගෙන තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා වක්‍ර ආකාරයෙන් දායක වන බව කාරුණිකව දන්වමි. | තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධායක මට්ටමේ තනතුරු 06 ක්, වර්ෂ 2 ත් 6 ත් කාලයක සිට වැඩබැලීමට/රාජකාරි ඉටු කිරීමේ පදනමට නිලධාරීන් බඳවාගෙන තිබුණු අතර අනුමත සංඛ්‍යාවඉක්මවා නිලධාරීන් තිදෙනෙකු බඳවාගෙන තිබුණි. | කොමිෂන් සභාව වෙත අනුමත කරගෙන ඇති විධායක මට්ටමේ තනතුරු 06 කට සුදුසුකම් අනුව වැඩ බැලීමට/ රාජකාරි ඉටු කිරීමට නිලධාරීන් පත්කර ඇත. ඉදිරියේදී පූර්ණ කාලීනව එම තනතුරු සඳහා නිලධාරීන් අනුයුක්ත කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා පූර්ණ කාලීනව නිලධාරීන් අනුයුක්ත කළ යුතු වේ. |